// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 1757/4 - 2012 මැයි 09 වැනි බදාදා - 2012.05.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත**

5 වැනි වගන්තිය යටතේ නියෝගය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි වගන්තිය සමග කියවිය යුතු 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින්, එම වගන්තිය යටතේ, 2012 අප්‍රේල් මස 04 වැනි දින අංක 1752/17 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් අවසන් වරට සංශෝධිත 2006 ඔක්තෝබර් මස 05 වැනි දින අංක 1465/20 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගයෙහි උපලේඛනයේ 27 වැනි අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන නව අයිතමය එකතු කිරීමෙන් සංශෝධනය කරමි.

**උපලේඛනය**

"28. ශ්‍රී ලංකා රජය සතු යම් කොටසක් මාරුකිරීම හෝ පැවරීම සම්බන්ධයෙන් වන යම් කොටස් සහතිකයක්."

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2012 අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ දී ය.

05 - 574

1A - G 016000 — 855 (2012/05)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.